# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය - 2018/2019

## නර්තන හා නාට්‍ය කලා පීඨය

## <u>කලාවේ දර්ශනය සහ සෞන්දර්ය සංකල්ප – DDCT 11012</u>

කාලය :- පැ 03

❖ සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

---

❖ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් (02) සහ ප්‍රශ්න දහයකින් (10) සමන්විත ය.

❖ <u>එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් හෝ තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක්</u> පිළිතුරු සපයන්න.

❖ එක් එක් කොටස සඳහා පිළිතුරු සැපයීමේ දී පිළිතුරු ලියන පොත් වෙන වෙනම භාවිත කළ යුතු ය.

❖ සෑම ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කරන්න.

❖ සියලුම ප්‍රශ්න සඳහා සමාන ලකුණු ලැබේ. (එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 16 ක් හිමිවේ.)

---

## <u>I කොටස</u>

01. පහත දක්වා ඇති කරුණු අතරින් අවම වශයෙන් කරුණු තුනක් (03) තෝරාගෙන කලාවේ වෙනස ඇතිවීම සඳහා එමගින් සිදුකරනු ලැබූ බලපෑම සාකච්ඡා කරන්න.
   i. මානවයාගේ ජීව විද්‍යාත්මක සාධක
   ii. පුද්ගල අරමුණු සහ අභිමතාර්ථ
   iii. මිනිසාගේ මූලික ගති ස්වභාවයන්
   iv. පුද්ගල අත්දැකීම්
   v. කලා විචාර සහ මතවාද
   vi. අගම්‍ය විජානනය

02. “ප්‍රාසංගික කලා ශිල්පියෙකු සතු මානසික, ශාරීරික අවබෝධය හා පුහුණුව සිය නිර්මාණශීලී ප්‍රතිභාව විදරණය කිරීමට උපකාරීවේ.” විමසන්න.

03. සංජානනය හඳුන්වා, සංජානන ක්‍රියාවලිය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක විස්තර කරන්න.

04. “සෞන්දර්ය” (aesthatic) “ලස්සන” (beauty) සහ “රසය” (tast) පිළිබඳ සමාජ ආකල්පය කාලානුරූපීව වෙනස් වූ ආකාරය උදහරණ සහිතව පෙන්වා දෙන්න.

05. කලා කෘතියක් ඇගයීමේදී කලාකරුවා සහ දර්ශනිකයා අතර වෙනස සෛද්ධාන්තිකව පැහැදිලි කරන්න.

## <u>II කොටස</u>

06. “කලාව සහ සෞන්දර්ය එකිනෙකට විරෝධි මතවාදවලින් යුක්තය.” බලියාග කලාව උදහරණයට ගෙන විස්තර කරන්න.

07. ලියෙෆ් තොල්ස්තෝයි හෝ ඇරිස්ටෝටල් පිළිබඳ හඳුන්වා ඔවුන් විසින් කරන ලද කලාවේ විග්‍රහයන් පිළිබඳ විමසීමක් කරන්න.

08. ඇරිස්ටෝටල් විසින් හඳුන්වා දෙන ලද කාව්‍යය රචනය හා නිර්මාණ කාර්යයෙහි යෙදෙන්නන් විසින් අනුගමනය කළ යුතු ශිල්පධර්ම කවරේදැයි සාකච්ඡා කරන්න.

09. “සාර්ථක නිර්මාණයක් බිහිවීමට අත්දැකීම් හා පරිකල්පනය ඉවහල්වේ.” විමසන්න.

10. “සාර්ථක නිර්මාණයක් බිහිවීමට නිර්මාණකරුගේ සහානුභූතිය හා හැඟීම් වැදගත්වේ.” මෙම අදහස පිළිබඳ විමසීමක් කරන්න.

…………………. 2021.04.27